


# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන
4 වන කාණ්ඩය
ඔක්තෝබර් 2020

01 20 වන ව්‍යවස්ථා සංශෝධනය සම්මතයි

03 "පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සෞඛ්‍ය ආරක්ෂක විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුයි" - කථානායක

03 කොවිඩ් - 19 වෛරසය වැලැක්වීම සඳහා වන දේශීය ඖෂධ කථානායකවරයාට පිළිගන්වයි

04 "වසර 2015 දී ගල් අඟුරු මිලදී ගැනීමේදී රුපියල් බිලියන 1.1 ක පාඩුවක්, කෝප් කමිටුවේදී හෙළිදරව් වෙයි

06 තිරසර සංවර්ධන සභාව සක්‍රීය කිරීම පිළිබඳව කෝපා කමිටුවේ අවධානය

08 රාජ්‍ය ආයතන තුළ සිදු කෙරෙන දූෂණ සහ අක්‍රමිකතා ක්ෂණිකව දැනුම්දීමේ ක්‍රමවේදයක්

සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

# 20 වන ව්‍යවස්ථා සංශෝධනය සම්මතයි




> “එම සංශෝධන පනත් කෙටුම්පත් විවාදය ඔක්තෝබර් 21 සහ 22 දෙදින තුළ පැවති අතර එහි දෙවන හා තෙවන වර කියවීමට පක්ෂව ඡන්ද 156ක් සහ විරුද්ධව ඡන්ද 65ක් හිමිව තිබිණි”

1978 ව්‍යවස්ථාව සඳහා ඉදිරිපත් කළ විසිවන ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පසුගියදා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී තුනෙන් දෙකකට වඩා වැඩි බහුතරයකින් සම්මත විය.

එම සංශෝධන පනත් කෙටුම්පත් විවාදය ඔක්තෝබර් 21 සහ 22 දෙදින තුළ පැවති අතර එහි දෙවන හා තෙවන වර කියවීමට පක්ෂව ඡන්ද 156ක් සහ විරුද්ධව ඡන්ද 65ක් හිමිව තිබිණි.

20 වැනි ව්‍යවස්ථා සංශෝධනය ගැසට් කිරීමත් සමඟ එය අභියෝගයට ලක් කරමින් පාර්ශ්ව කිහිපයක් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් 39ක් ගොනු කොට තිබිණි. එයින් පෙත්සම්කරුවන් 37 ක් අධිකරණයට පැමිණි අතර ගැටලු සහගත වගන්ති සම්මත කිරීමට අවශ්‍ය නම් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයට අමතරව ජනමත විචාරණයකින්ද අනුමත විය යුතු බවට තීන්දුවක් ලබා දෙන ලෙස එම පෙත්සම්කරුවෝ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා සිටියහ. සංශෝධන කෙටුම්පතේ 5, 6, 9 (1), 14, 16, 25, 32, 33, 34, 35, 36, 37, 38 යන වගන්ති හා 40 වැනි වගන්ති අහිතකර බව පෙත්සම් මඟින් චෝදනා කර තිබිණි. ඊට අමතරව, අතරමැදි පෙත්සම්කරුවන් 20 ක් ද මීට සම්බන්ධ වීමට පෙත්සම් ගොනු කර තිබිණි. එනමුත්, කථානායකවරයා විසින් පසුගිය 20 වන දින පාර්ලිමේන්තුවේ දී ප්‍රකාශයට පත් කළ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අනුව ජනමත විචාරණයක් සඳහා යොමුවිය යුතු යැයි දක්වා තිබුණේ ජනාධිපති නිර්මුක්තිය, විගණන කොමිසම සම්බන්ධ කෘත්‍යයන්, පාර්ලිමේන්තුව විසුරුවාලීමේ අවම ධූර කාලය, මැතිවරණ කොමිසමේ උපමාන සහ කර්තව්‍යන් ඇතුළු වගන්ති සතරක් සඳහා පමණි. පනත් කෙටුම්පත් විවාදයෙන් පසුව පැවැති ඡන්ද විමසීමේදී පාර්ලිමේන්තුවේ පක්ෂ මාරුවකින් තොරව, සමගි ජන බලවේගයේ ජාතික ලැයිස්තු මන්ත්‍රිනී ගරු ඩයනා ගමගේ, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ මන්ත්‍රී ධූර දරන ගරු නසීර් අහමඩ්, ෆයිසාල් කාසිම්, එච්. එම්. එම්. හාරිස් සහ එම්. එස්. තවුෆික් යන මහත්වරුන් ද, මුස්ලිම් ජාතික සන්ධානයේ මන්ත්‍රී ගරු ඒ. ඒ. එස්. එම්. රහීම්, ද්‍රවිඩ මහජන පෙරමුණේ මන්ත්‍රී ගරු අරවින්ද් කුමාර් සහ සමස්ත ලංකා මුස්ලිම් කොන්ග්‍රසයේ මන්ත්‍රී ගරු ඉෂාක් රහුමාන් යන මහත්වරුන්ද පනත් කෙටුම්පතට පක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමද ජනමාධ්‍යයේ දැඩි අවධානයට ලක්විණි.

මෙම විවාදය අතරතුර,පසුගිය 22 වන දින ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාද පාර්ලිමේන්තු පරිශ්‍රයට පැමිණි අතර තවත් විශේෂත්වයක් වූයේ, හිටපු ජනාධිපති, ආණ්ඩු පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රී මෛත්‍රීපාල සිරිසේන ඡන්දය විමසන අවස්ථාවේ පාර්ලිමේන්තු සභා ගර්භයෙහි නොසිටීමයි.

පනත් කෙටුම්පත සම්බන්ධ කාරක සභා අවස්ථාවේදී විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් කිරිඇල්ල මහතා සමහර වගන්තිවලට විරෝධය පළ කළ අතර එයින් බොහෝ දෙනාගේ විමසුම් ඇස යොමුවූයේ ද්විත්ව පුරවැසිභාවය සහිත



පුද්ගලයන්ට මැතිවරණ සඳහා ඉදිරිපත්වීමට අවසර ලැබෙන වගන්තිය වෙතය. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙහි දැක්වුණේ, ද්විත්ව පුරවැසිභාවය 26 ව්‍යවස්ථාවේ තෙවෙනි කොටස අනුව පුරවැසියන්, පුරවැසි තත්ත්වය අත්පත් කරගන්නා ආකාරය අනුව වෙනස් ලෙස සැලකීම ව්‍යවස්ථාවට අනනුකූල ලෙස නොසලකා තීරණය ලබා දෙන බවකි. එම සංශෝධනය සම්බන්ධව විපක්ෂයේ විරෝධය එල්ලවීමෙන්, ඊට වෙනම ඡන්ද විමසීමක් පැවැත්වීමට තීරණය කිරීමට කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාට සිදුවිය. එම ඡන්ද විමසීමේදී, අදාළ වගන්තියට පක්ෂව ඡන්ද 157ක් සහ විරුද්ධව ඡන්ද 64ක් ද ලබාගැනීමට ආණ්ඩු පක්ෂය සමත් වූ හෙයින් එම වගන්තිය ද තුනෙන් දෙකකට වඩා වැඩි ඡන්දයකින් සම්මත විණි.

ද්විත්ව පුරවැසිභාවය පිළිබඳව ඡන්ද විමසීමේ තවත් විශේෂත්වයක් වූයේ, සමස්ත ලංකා මක්කල් කොන්ග්‍රසයේ දිගාමඩුල්ල දිස්ත්‍රික්කයේ මන්ත්‍රී ගරු එස්. එම්. එම්. මුෂාරෆ්, සංශෝධනය දෙවන වර හා තෙවන වර කියවීමේ දී විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළ ද මෙම වගන්තියට පමණක් පක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමයි.

මෙම විවාදයෙහි කාරක සභා අවස්ථාවෙහි තවත් අවධානයට ලක්වූ වගන්ති අතර, විනිශ්චයකාරයන්, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ විනිශ්චයකාරවරුන් පත් කිරීමේ අධිකාර බලය, මැතිවරණ කොමිසමේ පත්කිරීම් සහ ගණ පූර්ණය සංශෝධනය, අමාත්‍ය මණ්ඩලයේ සීමාව 19 වන ව්‍යවස්ථා සංශෝධනය අනුවම වෙනස් වීම, පාර්ලිමේන්තුව විසුරුවා හැරීම අවු.2 1/2 කට නොඅඩු කාල සීමාවක් වීම, විගණනය සඳහා රජයේ සමාගම් ඇතුළු ආයතන විවෘත වීම, ඉහළ අධිකරණවලට පත්කරන විනිසුරුවරුන්ගේ සංඛ්‍යාව වැඩි කිරීම මෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙනුවට පාර්ලිමේන්තු සභාව ක්‍රියාත්මක වීම ද වෙයි.

ඉහළ අධිකරණ නිලධාරීන්, රජයේ නිලධාරීන් සහ සියලුම කොමිසම් සභා සාමාජිකයන් නිර්දේශ කිරීම සඳහා 19 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ස්ථාපිත කළ සිවිල් සමාජය නියෝජනය කරන තිදෙනෙකුද ඇතුළුව සාමාජිකයන් දස දෙනෙකුගෙන් සමන්විත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙනුවට ප්‍රතිෂ්ඨාපිත පාර්ලිමේන්තු සභාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පහකගේ සංයුතියෙන් යුක්තය. මෙම පාර්ලිමේන්තු සභාව 18 වන ව්‍යවස්ථා සංශෝධනයේදී පැවති තත්ත්වයට සෑහෙන දුරට සමාන ලක්ෂණ දරන බවද නිරීක්ෂණය කළ හැකිය.

කෙසේ වෙතත්, 20 වන සංශෝධනය මෙලෙස වැඩි ඡන්දයෙන් සම්මත වීමෙන් අනතුරුව එය ව්‍යවස්ථාවට එක් කිරීමට නම් කථානායකවරයාගේ සහතිකය ලද යුතු වේ. ඊට පෙර, අමාත්‍යවරයා විවාදයේදී එකඟ වූ වගන්ති එක්කර තෙබසින්ම සංශෝධනය යළි පිරික්සීම හා අංකනය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් කාර්යංශයේ කාර්ය මණ්ඩලයේ වගකීමක් වූ අතර ඉන් පසුව පමණක් එය රජයේ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යැවිණි. පසුව නීති කෙටුම්පත් සම්පාදක විසින් එහිදී මුල් කෙටුම්පත හා සන්සන්දනය කර නිසි නීතිමය විමර්ශනයකින් පසුව එම කෙටුම්පත රජයේ මුද්‍රණාලයේදී මුද්‍රණය කිරීමෙන් අනතුරුව, ඔක්තෝබර් 29 වන දින දී කථානායකවරයාගේ අත්සන තැබිණි. මෙම සංශෝධනය රට කරවන ප්‍රමුඛ නීතිය වන ව්‍යවස්ථාවට එක්වන්නේ මෙම ක්‍රියාවලිය අවසානයේදීය. ඉනික්බිතිව, 1978 ව්‍යවස්ථාවේ 20 වන සංශෝධනය රජයේ මුද්‍රණාලයේදී මුද්‍රාපිතව, රජයේ ප්‍රකාශන කාර්යාංශය විසින් නිකුත් කරනු ඇත්තේ මෙරට පුරවැසියන්ගේ පරිශීලනය පිණිසය.

***බුද්ධිනී රාමනායක***
***මහජන සේවා කළමනාකාරිනී***
***සන්නිවේදන දෙපාර්තමේන්තුව***

පුවත්

# “පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සෞඛ්‍ය ආරක්ෂක විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුයි” - කථානායක



දිවයිනේ මේ වන විට නැවත උද්ගතව පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සෞඛ්‍ය ආරක්ෂක විධිවිධාන වලට අනුකූලව කටයුතු කිරීමේ අවශ්‍යතාව ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් අවධාරණය කරන ලදී.

ඒ මහතා මේ බව සඳහන් කළේ පසුගියදා පාර්ලිමේන්තුවේදී විශේෂ නිවේදනයක් නිකුත් කරමිනි.

ඒ අනුව පාර්ලිමේන්තුවට පැමිණීමේදී හා එහි රැඳී සිටියදී සෞඛ්‍ය බලධාරීන් විසින් දී ඇති උපදෙස් අනුව පනවා ඇති සෞඛ්‍ය ආරක්ෂණ විධිවිධාන තරයේ පිළිපදින ලෙසත්, එමෙන්ම, පාර්ලිමේන්තුවෙන් පිටතදී කටයුතු කිරීමේදීද, එම පිළිවෙත් අනුගමනය කරන ලෙසත් කථානායකවරයා මන්ත්‍රීවරයන්ගෙන් ඉල්ලා සිටියේය.

අමුත්තන් පාර්ලිමේන්තුවට කැඳවීමෙන් වැළකී සිටින ලෙස මෙන්ම, අදාල සෞඛ්‍ය ආරක්ෂක විධිවිධාන වලට අනුකූලව අත්‍යවශ්‍ය රාජ්‍ය නිලධාරීන් පමණක් පාර්ලිමේන්තුවට කැඳවන ලෙසත් සියළුම ගරු අමාත්‍යවරුන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින බවද ඒ මහතා ප්‍රකාශ කළේය.

මෙයට අමතරව පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය, සෙසු හා අනුබද්ධිත කාර්ය මණ්ඩල, පාර්ලිමේන්තු මාධ්‍යවේදීන්, සැපයුම්කරුවන් හා සේවා සපයන්නන්, ආරක්ෂක අංශ වලට අයත් කාර්ය මණ්ඩල ඇතුළු පාර්ලිමේන්තුවට පැමිණෙන සියළුම දෙනා විසින් සෞඛ්‍ය ආරක්ෂක විධිවිධාන අනුව කටයුතු කිරීමද අත්‍යවශ්‍ය වන බවද කථානායකවරයා නිවේදනය කළේය.

# කොවිඩ් - 19 වෛරසය වැළැක්වීම සඳහා වන දේශිය ඖෂධ කථානායකවරයාට පිළිගන්වයි





කොවිඩ් - 19 වෛරසය ආසාදිතයන්ට සහ එම වෛරසය ආසාදනය වීමට ඉඩකඩ තිබෙන පුද්ගලයන් ඉලක්ක කරගනිමින් නිපදවූ ඖෂධ වර්ග කිහිපයක් දේශිය වෛද්‍ය, ග්‍රාමීය ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍ය සිසිර ජයකොඩි මහතා විසින් කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාට පිළිගන්වන ලදී.

ආයුර්වේද දෙපාර්තමේන්තුව සහ ආයුර්වේද ඖෂධ සංස්ථාව ඒකාබද්ධව ප්‍රතිශක්තිකරණ පානයක් සහ ආසාදිතයන් වෙනුවෙන් චූර්ණයක් හඳුන්වාදී තිබෙන බවද අමාත්‍යවරයා එම අවස්ථාවේදී ප්‍රකාශ කළේය.

මෙම ඖෂධ සියල්ල 100% ම දේශිය ශාකසාර යොදා ගනිමින් නිෂ්පාදනය කර තිබෙන බව පවසන අමාත්‍යවරයා සදංග පානය සහ සුවධරණී ප්‍රතිශක්තිකරණ පානය නමින් එම ඖෂධ නම් කර තිබෙන බවද සඳහන් කළේය.

බටහිර වෛද්‍ය විද්‍යාවට තවමත් කොවිඩ් -19 වෛරසයට එරෙහි ඖෂධයක් මෙතෙක් සොයා ගැනීමට නොහැකි වී ඇති බවත්, එබැවින් බටහිර වෛද්‍ය විද්‍යාව දියුණු රටවල් අද බරපතළ කඩා වැටීමකට ලක් වී ඇති බවත්, අමාත්‍යවරයා පෙන්වා දුන්නේය.

කෙසේ නමුත් දේශිය වෛද්‍ය අමාත්‍යාංශයට මෙම අභියෝගය ජයගත හැකි ඖෂධ නිෂ්පාදනය කිරීමට හැකියාව ලැබී තිබෙන බවද ඇමතිවරයා පැවසීය.

විශේෂාංග

# "වසර 2015 දී ගල් අඟුරු මිලදී ගැනීමේදි රුපියල් බිලියන 1.1 ක පාඩුවක්" කෝප් කමිටුවේදී හෙළිදරව් වෙයි




වසර 2015 දී ගල් අඟුරු මිලදී ගැනීමට ටෙන්ඩර් කැඳවීමේදි ගල් අඟුරු කැටවල ප්‍රමාණය සඳහන් නොවීම හේතුවෙන්, රුපියල් බිලියන 1.1 ක පාඩුවක් සිදුව ඇති බව පසුගියදා පාර්ලිමේන්තුවේදි පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදි කරුණු අනාවරණය විය.

ශ්‍රී ලංකා ගල් අඟුරු සමාගම දිගුකාලීන ටෙන්ඩර් ක්‍රමවේදයෙන් බැහැරව කෙටිකාලීන ක්‍රමවේදය යටතේ ගල්අඟුරු මිලදීගැනීම සිදුවී ඇත්තේ නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් තොරව බවද පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී අනාවරණය විය.

මෙම කරුණු අනාවරණය වුයේ ශ්‍රී ලංකා ගල් අඟුරු සමාගම මඟින් සිදුකරන ලද ගල් අගුරු මිලදීගැනීම් සම්බන්ධයෙන් විමසීමට එම සමාගමේ ඉහළ නිලධාරීන් පිරිසක් කැඳවමින් පාර්ලිමේන්තුවේදී පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පළමු රැස්වීමේදීය.

පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය ගරු චරිත හේරත් මහතාගේ ප්‍රධානත්වයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මෙසේ රැස්වූ අතර අමාත්‍ය මහින්ද අමරවීර, අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ, රාජ්‍ය අමාත්‍ය නාලක ගොඩහේවා, රාජ්‍ය අමාත්‍ය සරත් වීරසේකර, රාජ්‍ය අමාත්‍ය අජිත් නිවාඩ් කබ්රාල් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු වන පාඨලී චම්පික රණවක, එරාන් වික්‍රමරත්න, ජගත් පුෂ්පකුමාර, ප්‍රේම්නාත් සී. දොලවත්ත, එස්.එම්.මරික්කාර්, රවුෆ් හකීම් යන මහත්වරු මීට සහභාගී වුහ.

මෙහිදී දීර්ඝකාලීන ක්‍රමවේදයෙන් තොරව කෙටිකාලීන ක්‍රමවේදය යටතේ ගල් අඟුරු මිලදී ගැනීම මඟින් වෙළඳපොළේ සිදුවන මිල උච්චාවචනය වීමේ වාසිය ලබාගැනීමට තමන් බලාපොරොත්තු වූ බව එම නිලධාරීහු කමිටුවට පැවසූහ. නමුත් නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව යමින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව මෙම ටෙන්ඩර් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පොදු ව්‍යාපාර පිළිබද කාරක සභාවේ සභාපති චරිත හේරත් මහතා මෙහිදී පෙන්වා දුණි.

නොරොච්චෝලේ ලක්විජය බලාගාරය 2011 පෙබරවාරි 13 ජාතික විදුලිබල පද්ධතියට එක්කොට ඇත්තේ මෙගාවොට් 900 විදුලි අවශ්‍යතාවයක් සපුරාලීමට වුවද එහි මෙගාවොට් 90 රික්තකයක් පවතින බව කෝප් කමිටුවේදී අනාවරණය විය. මේ අනුව සැබෑ වශයෙන්ම නිපදවෙන්නේ මෙගාවොට් 810ක් පමණක් බවත් මෙගාවොට් 90 රික්තකයක් යනු නොසලකාහැරීමට නොහැකි විදුලි අවශ්‍යතාවක් බව කෝප් කමිටුව හමුවේදී තවදුරටත් අනාවරණය විය.

අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටු ලේකම්වරයා අවස්ථා 8කදී ප්‍රසම්පාදන කමිටුවේ නොසිට අතිරේක ලේකම්වරයෙක් ඒ සඳහා යොදවා ඇති බව අනාවරණය වී ඇති බවත් මේ නිසා ගන්නා තීරණවල නීත්‍යානුකූලභාවය සම්බන්ධයෙන් ගැටලුවක් පවතින බවත් කෝප් කමිටුවේදී අවධානයට ලක්විය.කෙසේ නමුත් අතිරේක ලේකම්වරයෙක් මේ සඳහා යෙදවීමට හැකියාව පවතින බව පැමිණ සිටි නිලධාරීහු පැවසූහ. මෙය

නිවැරදිද යන්න සොයාබලා වහාම වාර්තාවක් කොප් කමිටුවට ලබාදෙන ලෙස සභාපතිවරයා නිර්දේශ කළේය.

මිලියන 1100 වියදමින් ලංකා බිදුලිබල මණ්ඩලය මිලදීගත් බත්තල් 3ක් මේ වන විට ශ්‍රී ලංකා නාවික හමුදාවේ පරිහරණයට ලබාදී ඇත්තේ ඇයිද යන්න පිළිබඳව කමිටුවේදී ප්‍රශ්න කෙරුණ අතර මෙම බත්තල් ශ්‍රී ලංකා නාවික හමුදාවට භාරදුන් ක්‍රමවේදය, ඒවා නඩත්තු කිරීමට නොහැකිවීමට හේතුව කුමක්ද යන්න පිළිබඳ වාර්තාවක් වහා ලබාදිය යුතුයැයි කෝප් කමිටුව අමාත්‍යාංශ ලේකම්වරියට නියෝග කළේය.

එසේම ගල් අඟුරු සැපයීම සම්බන්ධව වසර 5 පළපුරුද්දක් අවශ්‍ය බව පුවත්පත් දැන්වීම්වල පළකොට තිබුණද අයදුම්පත් නිකුත් කිරීමේදී වසර 3ක පළපුරුද්දක් සහිත ආයතන වෙත අයදුම්පත් නිකුත්කිරීම පිළිබඳ මෙහිදී සාකච්ඡා කෙරුණි. මේ නිසා ගල් අඟුරු සමාගමට අවාසි සහගත තත්ත්වයක් ඇතිවී ඇති බවද කමිටුවේ අදහස විය. ලංසු කැඳවීමේ අවසන් දිනය පිළිබඳ විධිමත් ක්‍රමවේදයක් නොපවතින බවත් කමිටුව විසින් සාකච්ඡාවට බඳුන් කරන ලදි. මේ කරුණු පිළිබඳව විධිමත්ව සොයාබැලිය යුතු බව කමිටුව තීන්දු කළේය.

ගල් අඟුරු මිලදීගැනීමට ශ්‍රී ලංකා නැව් සංස්ථා සම්බන්ධවීම මඟින් සාමාන්‍ය ටෙන්ඩර් ක්‍රමය යටතේ වෙනත් ආයතනයක් හරහා ගල්අඟුරු මිලදීගැනීමට වඩා පාඩුවක් සිදුවන්නේද යන්න පිළිබඳවද කමිටුවේ අවධානය යොමුවිය. මේ සම්බන්ධයෙන් සොයාබලා හැකි ඉක්මනින් වාර්තාවක් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කළ යුතු බවටද මෙහිදී කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

එසේම ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා නැව් සංස්ථාව, ලංකා ගල් අඟුරු සමාගම, අදාළ රේඛීය අමාත්‍යාංශය යන ආයතන හතර නිතර හමුවී සාකච්ඡා කිරීමේ අවශ්‍යතාවය පිළිබඳවද කමිටුවේ අවධානය යොමු වූ අතර ඩීසල් බලාගාර සහ ගල් අඟුරු බලාගාර සඳහා යන වියදම පිළිබඳවද කෝප් කමිටු සාමාජිකයන්ගේ අවධානය යොමුවිය.

සාකච්ඡා කළ මෙම කරුණු සම්බන්ධව සියලු වාර්තා මාසයක් ඇතුළත කෝප් කමිටුව වෙත ලබාදෙන ලෙස කෝප් කමිටු සභාපතිවරයා විසින් මෙහිදී අවසාන වශයෙන් නිර්දේශ කරන ලදි.

# ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තුවෙහි මාධ්‍ය මධ්‍යස්ථානය සහ එහි කටයුතු



පාර්ලිමේන්තු වාර්තාකරණයේ නියැළෙන මාධ්‍යවේදින්ගේ කටයුතු වඩාත් විධිමත්ව සහ කාර්යක්ෂමව ඉටු කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ මාධ්‍ය මධ්‍යස්ථානයක් ස්ථාපිත කොට ඇත. පාර්ලිමේන්තුවේ තෙවන මහලේ පිහිටා ඇති මෙය නවීන තාක්ෂණික පහසුකම්වලින් සමන්විත වන අතර මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය ආයතනවල මාධ්‍යවේදීන් 70කට ආසන්න ප්‍රමාණයකට ආසන පහසුකම් සපයා තිබේ.

මේ සෑම ආසනයකටම අන්තර්ජාල පහසුකම් සපයා තිබේ. පටිගත කිරීමේ මැදිරි, රූපවාහිනි යන්ත්‍ර, හඬ සහ රූප පටිගත කිරීමේ පහසුකම් ඇතුළු නවීන අංගෝපාංග රැසකින් පාර්ලිමේන්තු මාධ්‍ය මධ්‍යස්ථානය සමන්විතය.

පාර්ලිමේන්තු රැස්වීම් මෙන්ම කෝප්, කෝපා ඇතුළු කමිටු රැස්වීම් ද මෙම මාධ්‍ය මධ්‍යස්ථානයේ ඇති පුළුල් රූපවාහිනි තිර මඟින් සජීවීව නැරඹීමේ හැකියාව ඇති අතර අවශ්‍යනම් එම දර්ශන පසුව බාගත කරගැනීමේ පහසුකම් ද (Download) සලසා ඇත.

තවද මෙම මාධ්‍ය මධ්‍යස්ථානයේ අති නවීන පහසුකම්වලින් සමන්විත රූපවාහිනි මැදිරියකි. එහි රූපවාහිනි සාකච්ඡා යනාදී නිෂ්පාදන කටයුතු සජීවීව හෝ පටිගත කිරීම් ලෙස සිදු කළ හැකි ය. මෙම සියලු කටයුතු පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයෙන් සිදු වන අතර ඕනෑම මාධ්‍යවේදියෙකුට හෝ මන්ත්‍රීවරයෙකුට සන්නිවේදන දෙපාර්තමේන්තුව හරහා මෙය වෙන් කරවාගත හැකිය. මේ වන විටත් සන්නිවේදන දෙපාර්තමේන්තුව මෙම මැදිරිය භාවිත කරමින් වැඩසටහන් ගණනාවක් නිෂ්පාදනය කර ඇත. පාර්ලිමේන්තුවේ කෝප්, කෝපා ඇතුළු කමිටු මාධ්‍යයට විවෘත වීමත් සමඟ මාධ්‍යවේදීන්ගේ සහභාගීත්වය වැඩි වශයෙන් සිදු වන අතර එකී සියලු කටයුතු පහසු කර ගැනීමට පාර්ලිමේන්තු මාධ්‍ය මධ්‍යස්ථානයෙන් ලැබෙනුයේ මහඟු පිටිවහලකි.

**පුවත්**

# තිරසර සංවර්ධන සභාව සක්‍රීය කිරීම පිළිබඳව කෝපා කමිටුවේ අවධානය




තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් පිහිටුවා ඇති තිරසර සංවර්ධන සභාව වසර 05ක් තිස්සේ අක්‍රීයව පැවතීම ගැටලුවක් බවත්, එය සක්‍රීය මට්ටමට රැගෙන ඒම සඳහා කඩිනමින් ක්‍රියා කළ යුතු බවත් රජයේ ගිණුම් පිළිබද කාරක සභාවේ දී සාකච්ඡා විය.

තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා පෙර සූදානම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ රජයේ ගිණුම් පිළිබද කාරක සභාවේ පැවැති සාකච්ඡාවේ දී අදහස් දැක්වූ එහි සභාපති මහාචාර්ය තිස්ස විතාරණ මහතා පැවසුවේ තිරසර සංවර්ධන සභාව පිහිටුවා වසර 05ක් ගත වී ඇතත, මෙතෙක් එය අක්‍රීයව පැවැතීමට හේතු සොයා බැලිය යුතු බවයි.

තිරසර සංවර්ධන ව්‍යාපෘති වලට අදාළ දත්ත ලබා ගැනීමේ ක්‍රමවේදය ප්‍රමිතිගත කිරීමේ අවශ්‍යතාවය ද කාරක සභාවේ දී සාකච්ඡා විය. වැරදි දත්ත මත ක්‍රියාත්මක වීම මඟින් ගැටලු රැසක් මතුව තිබීම සම්බන්ධයෙන්ද කාරක සභාවේදී අවධානය යොමු විය. අරමුණු 17 ක්, ඉලක්ක 169 කින් හා දර්ශක 244 කින් යුත් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයෙහි දැක්වෙන සංවර්ධනය වසර 2030 වන විට ළඟා කර ගැනීම අපේක්ෂාව බැවින් ඒ සඳහා විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය ද මෙහිදී සාකච්ඡා වීම විශේෂත්වයකි.

ලසන්ත අලගියවන්න, සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ, ප්‍රසන්න රණවීර යන ගරු රාජ්‍ය අමාත්‍යවරු ද, තිස්ස අත්තනායක, නිරෝෂන් පෙරේරා, ෆයිසාල් කාසීම්, අශෝක් අබේසිංහ, බුද්ධික පතිරණ, කාදර් මස්තාන්, උපුල් ගලප්පත්ති, මහාචාර්ය රංජිත් බණ්ඩාර, හරිනි අමරසූරිය යන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෝද කාරක සභාවට සහභාගී වූහ.

# කෝප් සහ කෝපා රැස්වීම් කොරෝනා හේතුවෙන් කල් යයි




පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (කෝප් කමිටුව) සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (කෝපා කමිටුව) මඟින් ඔක්තෝබර් මාසයේදී පැවැත්වීමට නියමිතව තිබූ කමිටු රැස්වීම් තාවකාලිකව කල් දැමිණි.

රටේ පවතින වත්මන් කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුකොටගෙන මහජන ඒකරාශිවීම් වැළැක්වීම සහ සමාජ දුරස්ථභාවය රඳවා ගැනීම යන සෞඛ්‍ය නිර්ණායක පදනම්ව කෝප් කමිටුවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය චරිත හේරත් මහතා සහ කෝපා කමිටුවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය තිස්ස විතාරණ මහතා මෙම තීරණය ගනු ලැබූහ.

**විශේෂාංග**

# සමස්තයක් ලෙස සැලකීමේදී සමාජ මාධ්‍ය, ප්‍රධාන ධාරාවේ මාධ්‍යයට තවමත් අභියෝගයක් නොවේ - *විශ්‍රාමික මහාචාර්ය අජන්තා හපුආරච්චි, කොළඹ විශ්වවිද්‍යාලය*



**01. ඔබ ජනසන්නිවේදනය පිළිබඳ ලංකාවේ සිටින එකම මහාචාර්යවරිය, මාධ්‍ය ක්ෂේත්‍රයේ ඔබේ අත්දැකීම් මොනවාද ?**
පුද්ගලික වශයෙන් කතා කළොත් මම ලේක් හවුස් ආයතනයේ පුරා වසර 15 ක් සේවය කළා. එහිදී ජනමාධ්‍යවේදිනියක ලෙස ඉතා විශාල වශයෙන් අත්දැකීම් ලබා ගත්තා. තේවිස් ගුරුගේ මහතා යටතේ ජාතික ගුවන් විදුලියේදී ප්‍රබල පුහුණුවක් ලැබුවා. එම පුහුණුව හරිම ක්‍රමවත්, එය අදටත් මගේ ජීවිතයට ඉතා වැදගත්. ඒ වගේම මම සෑම ජනමාධ්‍යයක් සමඟම සමීපව කටයුතු කරනවා.

**02. මුද්‍රිත මාධ්‍යයේ සිට සමාජ මාධ්‍ය දක්වා මාධ්‍යයේ විකාශය ඔබතුමිය අර්ථ දක්වන්නේ කෙසේද ?**
මානව පරිණාමනයේ වර්තමාන ස්වරූපය තමයි ගෝලීයකරණය. එහි ප්‍රතිඵලයක් ලෙස තමයි සමාජ මාධ්‍ය බිහිවන්නේ, එනම් මුද්‍රිත මාධ්‍යයේ සිට සමාජ මාධ්‍ය දක්වා මාධ්‍යයේ විකාශය මානව සහ සමාජ පරිණාමයට සාපේක්ෂව සිදු වූ දෙයක්. නමුත් වර්තමානයේදී වෙනස් සංකල්පයක් පිළිබඳව අද සාකච්ඡා වෙනවා, ඒ තමයි නිර්ගෝලියකරණය. කෝවිඩ් 19 තත්ත්වය හමුවේ තමයි මෙම සංකල්පය ගැන වර්තමානයේ පුළුල් අවධානයක් යොමුව තිබෙන්නේ. නිර්ගෝලියකරණය හමුවේ සමාජ මාධ්‍යයේ ක්‍රියාකාරීත්වය ගැන නැවත සිතා බැලිය යුතුයි.

**03. වර්තමානයේදී ජනතාවට විශ්වාසය තැබිය හැක්කේ කුමන මාධ්‍ය සම්බන්ධයෙන් ද ? ඒ සඳහා බලපාන හේතු කවරේද ?**
එය ඉතා සාපේක්ෂ කාරණයක්. මුලින්ම බිහි වුණේ මුද්‍රිත මාධ්‍ය, අතීතයේදී පොත හැඳින්වූයේ පොත් වහන්සේ කියලා. ඉන් අනතුරුව ගුවන් විදුලියත්, රූපවාහිනියත් බිහි වුණා. වර්තමානයේ වගකීම සහ මූලාශ්‍ර අතර යම් ගැටලු සහගත තත්වයක් තමයි දක්නට ලැබෙන්නෙ. වර්තමානයේදී සමාජ මාධ්‍යයේ ක්‍රියාකාරීත්වය ද ගැටලු සහගතයි. ඕනෑම අයෙකුට සමාජ මාධ්‍ය භාවිත කළ හැකියි. එයම ප්‍රබල ගැටලුවක්. මම හිතන්නේ තවමත් ජනතාවට විශ්වාසය තැබිය හැක්කේ රූපවාහිනිය, ගුවන් විදුලිය, පුවත්පත, පොත, සඟරාව වැනි ප්‍රධාන ධාරාවේ මාධ්‍ය සම්බන්ධවයි.

**04. සමාජ මාධ්‍ය, ප්‍රධාන ධාරාවේ මාධ්‍යට අභියෝගයක් වන්නේ කෙසේද ?**
වේගවත් බව අතින් සමාජ මාධ්‍ය, ප්‍රධාන ධාරාවේ මාධ්‍යට අභියෝගයක් තමයි. නමුත් කරුණු නිවැරදිව විශ්ලේෂණය කරන කොට පෙනී යන කාරණය තමයි තවමත් සමාජ මාධ්‍ය, ප්‍රධාන ධාරාවේ මාධ්‍යයට අභියෝගයක් නොවන බව. භාවිතය සහ ජනප්‍රියත්වය අතින් සමාජ මාධ්‍ය ලෝක තලයේ ඉදිරියෙන් ඉන්නවා. නමුත් ඇමෙරිකාව පවා අදවන විට වැඩි විශ්වාසයක් තබා තිබෙන්නේ රූපවාහිනී මාධ්‍ය සම්බන්ධවයි. සමාජ මාධ්‍ය තුළ අදටත් තොරතුරුවල විශ්වාසය පිළිබඳව ප්‍රබල ගැටලු රැසක් පවතිනවා. සමාජ මාධ්‍ය මඟින් තොරතුරු විකෘති කරන අවස්ථා ද දක්නට ලැබෙනවා. සමස්තයක් ලෙස සැලකීමේදී සමාජ මාධ්‍ය, ප්‍රධාන ධාරාවේ මාධ්‍යයට තවමත් අභියෝගයක් නොවේ.

**05. වත්මන් මාධ්‍ය ප්‍රමුඛත්වය දෙන්නේ ජනප්‍රිය සහ හදිසි පුවත්වලට, එසේ වීමට හේතු මොනවාද?**
ජනමාධ්‍ය ආයතනවල පවතින තරඟය තමයි ඊට මූලික හේතුව. වර්තමානයේදී ජනමාධ්‍ය ආයතන ආර්ථික සාධක මත තමයි ක්‍රියාත්මක වන්නේ. ඒ වගේම මාධ්‍ය හිමිකරුවන්ගේ න්‍යාය පත්‍රය බොහෝ කාරණාවලට පාදක වී තිබෙනවා. වර්තමානයේ දී ලෝකය තුළ සන්නිවේදනය ඕනෑවට වඩා ක්‍රියාත්මක වනවා. වර්තමානයේ ප්‍රවෘත්තිවල දක්නට ලැබෙන්නේ දුක විකුණන ආකාරය. හඬා වැටීම් සහ වැළපීම් තමයි ප්‍රධාන පුවත් බවට පත් වන්නෙ. මෙය ප්‍රබල ගැටලුවක්. මෙම තත්ත්වය ප්‍රබල ලෙස වෙනස් වෙන්න ඕන. වත්මන් මාධ්‍ය ප්‍රමුඛත්වය දෙන්නේ ජනප්‍රිය සහ හදිසි පුවත්වලට වීම හේතුවෙන් ප්‍රවෘත්තිවල ගුණාත්මකභාවය පිළිබඳව ගැටලු මතුව තිබෙනවා.

06. ජනමාධ්‍යට අදාළ වෘත්තිකයන් බිහිකරන විශ්වවිද්‍යාල වල පාඨමාලා වෙනස් විය යුත්තේ කෙසේද ?

මෙය ප්‍රබල ගැටලුවක්, ලංකාවේ විශ්වවිද්‍යාල වල පාඨමාලා වෙනස් විය යුතුයි. එම තත්ත්වය පිළිබඳව මම අදාළ පාර්ශව අවස්ථා ගණනාවක දී දැනුවත් කරලා තියෙනවා. ලොව ප්‍රධාන විශ්වවිද්‍යාල BBC ආයතනය සමඟ එක්ව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. ඒ තුළින් ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තියභාවය ඉහළ නැංවීමට කටයුතු කරනවා. ඒ වෙනුවෙන් ජාත්‍යන්තර විශ්වවිද්‍යාල BBC ආයතනය සමඟ අවබෝධතා ගිවිසුම් පවා අත්සන් කර තිබෙනවා. නමුත් ලංකාවේ එවැනි තත්ත්වයක් දක්නට නෑ. ලංකාවේ ද එවැනි තත්ත්වයක් ඇති කරන්න ක්‍රියා කළ යුතුයි.

**07. ඔබතුමිය දකින විදියට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ කාර්යභාරය කුමක් විය යුතුද?**
නීති සම්පාදනය කරන ආයතනය පාර්ලිමේන්තුව. පාර්ලිමේන්තු මන්ත්‍රිවරයන් පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය ආරක්ෂා කරන්න කටයුතු කරන්න ඕන. ඒ වගේම පාර්ලිමේන්තුවේ විපක්ෂය ප්‍රබුද්ධ විය යුතුයි. එය ඉතා වැදගත්, මන්ත්‍රීවරයන් අලුත් විදියට ලෝකය දකින්න ඕන. යටත්විජිත මානසිකත්වයෙන් අපි මිදිය යුතුයි. ඒ වගේම රටේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීමට පාර්ලිමේන්තු මන්ත්‍රිවරයන් කැපවිය යුතුයි. ඒ වගේම තාර්කික බුද්ධිය මෙහෙයවා කටයුතු කළ යුතුයි. සාම්ප්‍රදායිකත්වයෙන් මිදී පැවැරී ඇති ජාතික වගකීම ඉටු කිරීමට පාර්ලිමේන්තු මන්ත්‍රිවරයන් ක්‍රියා කිරීම ඉතා වැදගත්.

සාකච්ඡා කළේ -
***එච්. ඩී. එදිරිවීර ගුණසේකර***
***මාධ්‍ය නිලධාරී***
***සන්නිවේදන දෙපාර්තමේන්තුව***

**පුවත්**

# රාජ්‍ය ආයතන තුළ සිදු කෙරෙන දූෂණ සහ අක්‍රමිකතා ක්ෂණිකව දැනුම්දීමේ ක්‍රමවේදයක්

රාජ්‍ය ආයතන තුළ සිදු කෙරෙන දූෂණ සහ අක්‍රමිකතා පිළිබඳව ක්ෂණිකව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට (කෝපා) දැනුම්දීම සඳහා ක්‍රමවේදයක් සැකසීමට එම කාරක සභාවේ අවධානය යොමු විය. කාරක සභාවේ සභාපති මහාචාර්ය තිස්ස විතාරණ මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේදී පසුගියදා රැස්වූ අවස්ථාවේ මේ පිළිබඳව සාකච්ඡා විය.

කෝපා කමිටුව පිළිබඳව එහි සාමාජික මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම සඳහා පැවැති මෙම කාරක සභා රැස්වීමේදී අදහස් දැක්වූ සභාපතිවරයා පැවසුවේ ඉදිරියේදී පැවැත්වෙන රැස්වීම් මාධ්‍යයට විවෘත කරන බවයි.

විගණන වාර්තාවල පෙන්නුම් කරන ගැටලු වලට බලපාන ලද නියම හේතු සාධක සෙවීම පිළිබඳව කාරක සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතු බවද සභාපතිවරයා මෙහිදී පෙන්වා දුන්නේය. පාර්ලිමේන්තුවට සහ කාරක සභාවට පවතින බලතල ප්‍රකාරව රාජ්‍ය ආයතන තුළ පවතින ගැටලු විසඳීම සඳහා කටයුතු කළ යුතු බවත්, පාර්ලිමේන්තුව මඟින් ලබා දෙන මුදල් නිසි අයුරින් වියදම් කරන්නේද සහ එහි කාර්ය සාධනය කවරේද යන්න පිළිබඳව අවධානය යොමු කළ යුතු බවත් හෙතම පෙන්වා දුන්නේය.

මෙහිදී අදහස් දැක්වූ විගණකාධිපතිවරයා පැවසුවේ, මූල්‍ය විගණනය මෙන්ම ආයතනවල කාර්ය සාධනය පිළිබඳව විශේෂ අවධානයක් යොමුකළ යුතු බවයි. කාරක සභා ජනමාධ්‍යට විවෘත කිරීම මඟින් කාරක සභාවේ කටයුතු පහසුවන බවද හෙතෙම පෙන්වා දුන්නේය.

කාරක සභාවේ හිටපු සභාපති, රාජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්න මහතා පැවසුවේ අටවන පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මඟින් සුවිශේෂී මෙහෙවරක් ඉටුකළ බවයි. රාජ්‍ය ආයතන 844ක් ඇගයීම සඳහා නිසි වැඩපිළිවෙලක් සැකසූ බවත්, එය ඉදිරියට පවත්වා ගැනීම ඉතා වැදගත් බවත් හිටපු සභාපතිවරයා මෙහිදී අවධාරණය කළේය. අදායම් ලබන ආයතන කඩිනමින් කාරක සභාවට ගෙන්වා පරීක්ෂා කළ යුතු බවද හෙතෙම අවධාරණය කළේය.

මෙහිදී අදහස් දැක්වූ පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම් ටිකිරි කේ. ජයතිලක මහතා පැවසුවේ පාර්ලිමේන්තුව සහ කාරක සභාව අතර සබඳතාවය තවදුරටත් වර්ධනය කිරීමට කටයුතු කරන බවයි. තිරසර සංවර්ධන ඉලක්ක ඉටු කර ගැනීම සඳහා කාරක සභාවේ අවධානය යොමුවිය යුතු බව ද ජයතිලක මහතා පැවසීය.

සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ, ප්‍රසන්න රණවීර යන ගරු රාජ්‍ය අමාත්‍යවරු ද, තිස්ස අත්තනායක, නිරෝෂන් පෙරේරා, ෆයිසාල් කාසීම්, අශෝක් අබේසිංහ, බුද්ධික පතිරණ, කාදර් මස්තාන්, උපුල් ගලප්පත්ති, මහාචාර්ය රංජිත් බණ්ඩාර, හරිනි අමරසූරිය යන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෝද කාරක සභාවට සහභාගී වූහ.

**විශේෂාංග**

# නේසම් ජාතික දේශපාලනයේ ආදරය



ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් බහුතරය වන 52% ක් කාන්තාවන් වුවද ඔවුන්ගේ දේශපාලන දායකත්වය පවතිනුයේ ප්‍රශස්ත මට්ටමක නොවේ. මෙරට ජනමාධ්‍ය පවා පුරුෂ දේශපාලඥයන් වෙනුවෙන් වෙන් කරන ඉඩ ප්‍රස්තා කාන්තා දේශපාලඥයන් සඳහා ලබාදෙනුයේ ඉතා අඩුවෙනි. එසේ තිබියදී පවා පසුගිය නවසීලන්ත මැතිවරණයෙන් යළි සිය ජයග්‍රහණය තහවුරු කරගත් අගමැතිනි ජෙසින්ඩා ආර්ඩින්ගේ කණ්ඩායමේ සිටින ලංකාවේ උපන් තරුණ වෘත්තිකාවට ලංකාවේ මාධ්‍ය සෑහෙන අවධානයක් යොමු කළේය. ඈ ගැන සඳහන් කරද්දී අඩුවෙන්ම අවධානය ලැබුණේ, ඇය මෙරට ව්‍යවස්ථාදායකය පළමු වරට නියෝජනය කළ ද්‍රවිඩ කාන්තාව වන ලුයිසා නේසම් සරවනමුත්තුගේ මී මිනිපිරිය යන්නටය. නේසම් ඇගේ නමේ වාච්‍යාර්ථයෙන්ම ආදරණීය වූවාය. මේ ඇගේ කථාවයි.

1931 සර්වජන ඡන්ද බලය ලැබෙන්නට පෙර සිටම කාන්තාවන් දේශපාලනයෙන් බැහැරව සිටිනු දක්නට ලැබෙද්දී 1919 මුල් භාගයේදී ශ්‍රී ලංකා ජාතික කොන්ග්‍රසයේදී ආචාර්ය නල්ලම්මා මුරුගේසු විසින් කාන්තා ඡන්ද අයිතියට පක්ෂව යෝජනාවක් සම්මත කරන ලදී. ඉන් පසුව, 1925 දී ඇග්නස් ද සිල්වා සහ ඇස්ලින් තෝමස් යන කාන්තාවන් ප්‍රමුඛ මල්ලිකා කුලඟන සමිතිය සීමාන්තික ඡන්ද බලය සමස්ත ලාංකික කාන්තාවන් සඳහා දීර්ඝ කළ යුතු යැයි යෝජනා කළහ. ප්‍රගතිශීලී ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ යෝජනා සමඟ ඩොනමෝර් කොමිසම සාක්ෂි විමසීමට පැමිණී අතර 1927 දෙසැම්බර් 07 වැනි දින ද මධ්‍යම පාන්තික කාන්තාවන්, වෘත්තීන්හි නියුක්ත කාන්තාවන්, මෙරට ප්‍රමුඛතම පිරිමි දේශපාලනඥයන්ගේ භාර්යාවන් හා වෙනත් ඥාතී කාන්තාවන් එක්ව පිහිටවූ ලංකාවේ කාන්තා අයිතිවාසිකම් සංගමය එහිදී සාක්ෂි දීමෙහි අවස්ථාවක් ඉල්ලා සිටියහ. ජෝර්ජ් ඊ. ද සිල්වා මහතාණන්ගේ උදව්වෙන් කොමිසම ඉදිරියට පැමිණ 1928 ජනවාරියේදී සාක්ෂි දෙමින් පන්ති කුල හා වාර්ගික වෙනස්කම් අතහැර සියලු කාන්තාවන්ට සමානාත්මතාවය ලබා දෙන ලෙස ඔව්හු ඉල්ලා සිටියෝය. මේ මතවාදය සඳහා සහයෝගය ලබාදෙමින් සාක්ෂි දුන්නේ කම්කරු සංගමයේ නායක ඒ. ඊ. ගුණසිංහ මහතා සහ උතුරු පළාත නියෝජනය කළ ඇස්. රාජරත්නම් මහතා පමණි. පසුකලෙක මෙම ස්ත්‍රී ව්‍යාපාරය අසාර්ථකව ගියද ඔවුන්ගේ මැදිහත්වීම අතිශයින් වැදගත් වන්නේ සර් මාක්ස් ප්‍රනාන්දු මහතා සහ සර් පොන්නම්බලම් රාමනාදන් මහතා වැනි ජ්‍යෙෂ්ඨ දේශපාලකයන් මේ සම්බන්ධව පළ කළ අදහස් නිසාය.



නේසම් සරවනමුත්තු මහත්මියගේ මී මිනිපිරියක් වන නීතිඥ වනුෂි වොල්ටර්ස් නම් වූ ඇය නවසීලන්ත පාර්ලිමේන්තුවට තේරී පත් වූ පළමු ශ්‍රී ලාංකිකයායි.

සර් පොන්නම්බලම් රාමනාදන් කොමිසම ඉදිරියෙහි සාක්ෂි ලබාදුන්නේ, ස්ත්‍රීන්ට ඡන්ද බලය ලබාදීම ඌරන් ඉදිරියේ මුතු විසිකිරීමකට සමාන කරමිනි. මෙම ප්‍රකාශයට පිළිතුරු දෙමින් ඇග්නස් ද සිල්වා මහත්මිය කියා සිටියේ, නියම ඌරන් නම් ස්ත්‍රීන් නූගත් යැයිද කිසි දෙයක් නොදත් අය යැයි ද සිතන අගතිගාමී පුරුෂයින් බවය. මෙම ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් ලෙස, 1931 දී පැවති මැතිවරණයේදී ලීලාවතී අසරප්පා බලන්ගොඩ ඡන්ද කොට්ඨාසය සඳහා තම අපේක්ෂකත්වය ගොනු කර තිබුණි. ඇය කොළඹ මහ නගර සභාවේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී වෛද්‍ය සී. වී. අසරප්පාගේ බිරිඳයි. ඔහු හිටපු අගමැති සිරිමාවෝ බණ්ඩාරනායකගේ පියා වන බාන්ස් රත්වත්තේගේ සහෝදරයාය. නාමයෝජනා ලැබුණද, ලීලාවතී අසරප්පා මුල් අවධියේදී තරඟයෙන් ඉවත් වූයේ පවුලේම සාමාජිකයෙකුට එරෙහිව තරඟ කිරීමට

නොහැකි වීම නිසා ඉවත් වන බව වාර්තාකරුවන්ට පවසමිනි. එහෙයින්, මීදෙනිය අදිකාරම හදිසියේ අභවප්‍රාප්ත වීම නිසා 1931 සැප්තැම්බර් මාසයේ පැවති අතුරු මැතිවරණයේදී ඇඩ්ලින් මොලමුරේ මැතිනිය තේරී පත් වූවේ මෙරට ව්‍යවස්ථාදායකයට පත් ප්‍රථම කාන්තාව ලෙස ඉතිහාසයට එක්වෙමිනි.

ප්‍රථම වරට දෙමළ කාන්තාවකගේ පෞරුෂය ලාංකික දේශපාලනය සටහන් කරමින් නේසම් සරවනමුත්තුගේ ආගමනය සිදුවන්නේ 1932 මැයි මාසයේදී කොළඹ උතුරේ පැවති අතුරු මැතිවරණයෙනි. ඈ 1931 දී කොළඹ උතුරු මැතිවරණ කොට්ඨාසයෙන් තේරී පත් වූ ආචාර්ය රත්නජෝති සරවනමුත්තුගේ බිරියයි. ඔහු කොළඹ මහ නගර සභාවේ පළමු නගරාධිපතිවරයා ලෙස තේරී පත් වූ සුප්‍රකට දේශපාලඥයෙකි. නේසම්, 1932 මැයි 30 වන දින අතුරු මැතිවරණයට ඉදිරිපත් වූයේ ඔහුගේ මැතිවරණය අවලංගු යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසු ඔහුගේ සිවිල් අයිතිවාසිකම් හත් වසරකට අවලංගු කිරීම නිසාය.

නේසම්, ඉංජිනේරුවරයෙකුගේ දියණියක වූ අතර 1897 දී යාපනයේ උපත ලැබුවාය. ඇගේ මව එමිලි තංගම්මා කුක් ය. වෙම්පඩි කාන්තා විද්‍යාලයේ අධ්‍යාපනය ලැබ 1915 දී වෛද්‍ය රත්නජෝති සරවනමුතු සමඟ විවාහ ප්‍රාප්ත වූ ඈ සිව් දරු මවකි.

1932 මැයි 30 වන දින පැවති අතුරු මැතිවරණයට තරඟ කරන විට නේසම්ට ඇගේ සැමියා දේශපාලනයෙන් උපයාගත් සංකේතීය ප්‍රාග්ධනය එලෙසින්ම උරුම විය. එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක සහ ඒ. ඔබයසේකර එලෙස දේශපාලන සහයෝගය ලබාදෙමින් නේසම් සරවනමුත්තුට සහාය දැක්වූවන් අතර වූහ. නේසම් සරවනමුත්තුට එරෙහිව තරඟ කළ වෛද්‍ය එච්. එම්. පීරිස් ද කොළඹ උතුරේ ඉතා බලපෑම් සහගත පුද්ගලයෙක් වූ නමුත්, නේසම් සරවනමුත්තු ඡන්ද 8681 කින් මැතිවරණය ජයගෙන පාර්ලිමේන්තුවට තේරී පත් වූ පළමු දෙමළ කාන්තාව බවට පත්වූවාය.

කෙසේවෙතත්, කාලයත් සමඟ ඈ විශාල පීඩාවන්ට හා පුරුෂාධිපතිවාදී දේශපාලනයේ බලපෑමකට ලක් වූ බව සැලකිල්ලට ගත යුතුය. ප්‍රජා අයිතිය අහිමිව සිටි දොස්තර සරවනමුත්තු තම බිරිඳගේ මැතිවරණයට උදව් කළ බැව් කියමින් ඉදිරිපත් කළ ඡන්ද පෙත්සමක් විභාග කිරීමෙන් අනතුරුව එම චෝදනාව පිළිගත් අධිකරණය 1932 සැප්තැම්බර් 27 වැනිදා ඇයගේ පත්වීම අවලංගු කළේය. 1932 නොවැම්බර් 12 වැනිදා පැවැති අතුරු මැතිවරණයට තම සැමියා වෙනුවෙන් නැවත ඉදිරිපත් වූ නේසම් සරවනමුත්තු මහත්මිය වැඩි ඡන්ද 7730 කින් නැවත උතුරු කොළඹ ආසනය ජය ගත්තාය.

දෙවන මැතිවරණය 1936 දී පැවැත්විණි. පළමු සභාවට තේරී පත් වූ කාන්තාවන් දෙදෙනෙකුගෙන් එක් අයෙකුට පමණක් යළිත් සිය ජනතාව නියෝජනයට අවකාශ සැලසිණි. රුවන්වැල්ල මැතිවරණ කොට්ඨාසයේ ඇඩ්ලින් මොලමුරේ මැතිනිය ආචාර්ය එන්. එම්. නිසා සිය අසුන අහිමි කරගත්තාය. එසේ වුවද, නේසම් සරවනමුත්තු සිටියේ කොළඹ උතුර විජයග්‍රහණයේ සතුට භුක්ති විඳිමිනි. තවත් දෙමළ කාන්තාවක් දෙවන පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වුවද තේරී පත් නොවිණි. ඈ නමින් හැටන් හි ලක්ෂ්මි රාජා රත්නම්ය. 1935 සිට 1947 දක්වා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සිටි ඇය 1936 රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සිටි එකම මන්ත්‍රීවරියයි.

නේසම් සරවනමුත්තු කලක් රෝගාතුර වී 1941 ජනවාරි 19 වන දින වයස අවුරුදු හතලිස් හතරේදී මිය ගියාය. ආචාර්ය රත්නජෝති සරවනමුත්තු ද දෙවන මැතිවරණයෙන් කොළඹ නගරාධිපති ධුරයට පත්වී එකොළොස් දිනකින් මිය ගියේය.

සර්වජන ඡන්දයෙන් දිනූ කත **ෆ්ලෝරන්ස් සේනානායක මැතිනියගේ** දේශපාලන තතු පිළිබඳ ලබන කලාපයෙන් බලාපොරොත්තු වන්න.


*ඉෂාරා වික්‍රමසිංහ*
*මහජන සේවා නිලධාරී*
*සන්නිවේදන දෙපාර්තමේන්තුව*



**කර්තෘ මණ්ඩලය**

*උපදේශනය*
ධම්මික දසනායක මහතා (පාර්ලිමේන්තු මහලේකම්)
නීල් ඉද්දවල මහතා (නියෝජ්‍ය මහලේකම් හා කාර්ය මණ්ඩලයේ ප්‍රධානී)
කුෂාණි රෝහණධීර මහත්මිය (සහකාර මහලේකම්)
ටිකිරි කේ. ජයතිලක මහතා (සහකාර මහලේකම්)

සංකල්පය *හා මඟපෙන්වීම*
ශාන් විජේතුංග මහතා

*ප්‍රධාන සංස්කරණය*
බුද්ධිනි රාමනායක මෙනෙවිය
එදිරිවීර ගුණසේකර මහතා
නිම්මි හාතියල්දේණිය මහත්මිය

*ඡායාරූපකරණය*
නුවන් දුමින්ද මහතා

*පිටු සැලසුම්කරණය*
ඉෂාරා වික්‍රමසිංහ මෙනෙවිය

*අන්තර්ජාලය හරහා බෙදාහැරීම*
ඒ.ජී.එම්.එම්.නුස්කි මහතා

විශේෂාංග

# කොවිඩ් පැරදූ නවසීලන්ත අගමැතිනියට වාර්තාගත ජයක්!



ඇතැම් බටහිර රටවල නායකයන්ට කොවිඩ් අභියෝගය මැතිවරණ හමුවෙහි පාරා වළල්ලක්ව තිබියදී පසුගිය ඔක්තෝබර් 17 වෙනි දින නවසීලන්තයේ 53 වැනි පාර්ලිමේන්තුව සඳහා සභිකයන් තෝරා පත්කරගැනීමට පැවති මහා මැතිවරණය ලෝකයාගේ ඉමහත් අවධානයට ලක්වූවක් විය.

පාර්ලිමේන්තුවේ සරල බහුතරය දිනා ගැනීමෙහිලා ජෙසින්ඩා ආර්ඩින්ගේ කම්කරු පක්ෂය සහ ජූඩිත් කොලින්ස්ගේ ජාතික පක්ෂය අතර පැවති ප්‍රබල සටනේදී නවසිලන්ත අගමැතිනි ජෙසින්ඩා ආර්ඩින් සිය පක්ෂය ඓතිහාසික ජයග්‍රහණයක් කරා මෙහෙයවීම කැපී පෙනෙන්නක් විය. ඒ 1993 සිට නවසීලන්ත ව්‍යවස්ථාදායකයේ බහුතර රජයක් පිහිටුවීමට හැකිවූ ප්‍රථම පක්ෂය බවට සිය කණ්ඩායමට නායකත්වය ලබාදෙමිනි.

ලෝකයේ වඩාත් ප්‍රශස්ත ආකාරයෙන් කොවිඩ්-19 වසංගතය පාලනය කළ රාජ්‍යයක් ලෙස නවසීලන්තය ඉහළට ඔසවා තැබීමට වත්මන් අගමැතිනි ජෙසින්ඩා ආර්ඩින්ගේ ක්‍රියාකලාපය නොමඳ ජනතා ආකර්ෂණයට පාත්‍ර විය. ඒ නිසා මෙවර මහා මැතිවරණයේ දී ජෙසින්ඩා ආර්ඩින් නායකත්වය ලබාදුන් කම්කරු පක්ෂයට ආසන 64ක් හිමි වූ අතර, එහි දී මැතිවරණ කොට්ඨාස 43ක් ජයග්‍රහණය කර, පක්ෂ ලැයිස්තුවෙන් ආසන 21ක් හිමිකර ගැනීමද විශේෂත්වයකි. වර්ෂ 1996 දී නවසීලන්තය තුළ හඳුන්වා දුන් මිශ්‍ර සාමාජික සමානුපාතික ඡන්ද ක්‍රමය තුළ මහා මැතිවරණයක දී යම් පක්ෂයක් පාර්ලිමේන්තුවේ සරල බහුතරය ඉක්මවා ගිය මුල්ම අවස්ථාව ලෙසින් මෙය ඉතිහාසගත විණි.

එසේ වුවද කොවිඩ් 19 අභියෝගකාරී සමයේ නවසීලන්තයේ කාරුණික අගමැතිනිය ලෙස ලොව පුරා අවධානයට ලක්වූ ඈ ඉදිරියෙන් ඇත්තේ සේද ඇතිරූ මාවතක් නොවන බව මැදිහත් විචාරකයන්ගේ මතයයි.

නවසීලන්තයේ ඕක්ලන්ඩ්වලටත් ඈතින් පිහිටි කුඩා ගම්මානයක සාමාන්‍ය පවුලකින් පැමිණි හතළිස් වියැති ඇය යොවුන් වියේදීම කම්කරු පක්ෂ ක්‍රියාකාරිනියක ලෙස කටයුතු කළාය. 2001 වර්ෂයේදී වයිකාටෝ විශ්ව විද්‍යාලයෙන් උපාධිය ලැබීමෙන් අනතුරුව ආර්ඩින් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කරනුයේ අගමැති හෙලන් ක්ලාක්ගේ කාර්යාලයේ පර්යේෂකයෙකු ලෙස සේවය කිරීමෙනි. පසුව ඇය ලන්ඩනයේ කැබිනට් කාර්යාලය තුළ සේවය කළ අතර ජාත්‍යන්තර සමාජවාදී තරුණ සංගමයේ සභාපතිවරිය ලෙස තේරීපත් වූවාය. 2008 මහ මැතිවරණයෙන් ප්‍රථම වරට මන්ත්‍රීවරියක් ලෙස තේරී පත් වන ඇය වයස අවුරුදු තිස් හතේදී ලොව ළාබාලතම කාන්තා රාජ්‍ය නායිකාව බවට පත් විය.

සමාජ ප්‍රජාතන්ත්‍රවාදිනියක ලෙසත්, ප්‍රගතිශීලි, ජනරජවාදී ස්ත්‍රීවාදිනියක ලෙසත් තමා නිර්වචනය කරන ආර්ඩින් වාර්තාගත මැතිවරණ ජයග්‍රහණයට පෙර කියා සිටියේ මෙය සිය රට මුහුණදෙන අසීරුතම අවධියක් බවයි. අපට ත්‍රස්තවාදී ප්‍රහාරයක් එල්ල වුණා පමණක් නොවෙයි, ස්වභාවික ආපදා සහ ගෝලීය වසංගතයකට එරෙහිවත් කටයුතු කිරීමට සිදු වූ බව කී. ආර්ඩින් එය තම අවධානයට ගන්නා බවද තිරසාර වචනවලට පෙරළුවාය. "නමුත් අපි අපේ උපරිමය අත්විඳ තිබෙන්නේ දුෂ්කර අවස්ථාවලදී, අපි කවුද බව දන්නා නිසාම අපට උස් බාධක ජයගන්නත්, මහා අභියෝගවලට මුහුණ දෙන්නත් හැකියි. අනෙක අපට සැලසුමක් තිබුණා"යි සඳහන් කළ ඇගේ ඍජු පටිපන්නභාවය තහවුරු වූයේ මෙලෙස අභියෝග ජයගැනීම නිසා පමණක් නොවේ.

වරෙක පරිසර සංරක්ෂණය වෙනුවෙන් නවසීලන්තය තුළ පොලිතින් හා ප්ලාස්ටික් භාවිතය තහනම් කළේ අනෙක් ලෝ නායකයන්ටද පූර්වාදර්ශයක් සපයමිනි.

එමෙන්ම, ලොවම සසල කළ ක්‍රයිස්ට්චර්ච් ප්‍රහාරයෙන් පසුව මාධ්‍ය ඇමතූ අගමැතිනිය තමන් ඝාතකයාගේ නම සඳහන් නොකරන බවද, පීඩාවට පත්වූවන්ගේ වේදනාව තමන්ට වැටහෙන බව පවසමින් එම ප්‍රජාව




ශක්තිමත් කළාය. දුකට පත්වූවන් වෙනුවෙන් ශෝකය පළ කළ ඇගේ හිස වැසුණේ හිජාබයකිනි. ඒ සංකේතයෙන් මෙන්ම සංක්ෂිප්ත කථාවෙන් ද මුළු ලෝකය හමුවේ විවිධත්වය අගයන ආකාරයේ පණිවුඩයක් තැබීමට ඈට හැකි වූ බව ජනමාධ්‍ය තක්සේරුව විණි.

මෙම සිද්ධියෙන් අනතුරුව අග්‍රාමාත්‍යවරිය "අපේ ගිනි අවි නීති වෙනස් වනු ඇති" යි පොරොන්දුව වචනවලට සීමා නොකර නවසීලන්තය තුළ අර්ධ ස්වයංක්‍රීය ගිනි අවි භාවිතය සහ ළඟ තබා ගැනීම සම්පූර්ණයෙන් තහනම් කිරීමටද ක්‍රියා කළාය.

කොවිඩ් 19 ව්‍යාප්තිය සාර්ථක ලෙස පාලනය කිරීමට ඇය ගත් නොමඳ උත්සාහය ද සියල්ලන්ගේම අවධානයට ලක් වූ තවත් කාරණාවක් විය. ඇය නිරන්තරයෙන් මාධ්‍ය මඟින් ප්‍රකාශ කර සිටියේ "අපි ආර්ථිකය ලිහිල් කරනවා. නමුත් අපි ජනතාවගේ ජීවිතය ලිහිල් කරන්නේ නෑ" යනුවෙනි. ජන ජීවිතය ආරක්ෂා කිරීමෙහිලා දැඩි කැපවීමෙන් ක්‍රියා කළ ඇය, නවසීලන්තය තුළ දැඩි සමාජ දුර්ස්ථකරණ නීති පනවා ඇති අතර අග්‍රාමාත්‍යවරිය ද වරෙක තේ පැන් හලක් ඉදිරියේ තමාගේ වාරය එන තෙක් ඉවසීමෙන් බලා සිටියාය. ඒ අත්දැකීම පිළිබඳ ඇය සඳහන් කළේ මමත් අනෙක් හැමෝම වගේ මගේ අවස්ථාව එනතෙක් බලාගෙන සිටියා යන්න පමණි.

වසර 50ක පමණ ඉතිහාසයක් තුළ ලබාගත් වැඩිම ඡන්ද ප්‍රතිශතය වාර්තා කරමින් ඇය මෙවර ලද ජයග්‍රහණය ඇගේ මුල් ධුර කාලය තුළ රට තුළ සිදුවූ අසාමාන්‍ය අවස්ථාවන් වලදී ඇය ලබා දුන් නායකත්වය ඇගයීමක් බව පැහැදිලිය.

2017 පරිවර්තනීය රජයක් ගැන ඡන්දදායකයාට පොරොන්දු වූ ඇගේ දෙවන පාලන සමය සඳහා වන නිශ්චිත සැලසුම් තවම අනාවරණය වී නැත. එසේ වුවද ඇය අනිවාර්යෙන්ම විරැකියාව, දරුවන්ගේ දරිද්‍රතාවය සහ නිවාස හිඟය සම්බන්ධය අවධානය යොමු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේම, මෑත ඉතිහාසයේ ඕනෑම අගමැතිවරයෙකු ලත් සුවිශාලතම ජන වරම ලත් ජෙසින්ඩා ආර්ඩ්න් සිය මධ්‍යම පන්තික ඡන්දදායකයන් සහ දිළිඳු ප්‍රජාව අතර අවශ්‍යතාවන්ගේ සංහිඳියාවක් ඇති කරගනු ඇත්තේ කෙලෙසින් දැයි නවසීලන්ත වැසියන් මෙන්ම දේශපාලන විචාරකයන්ද සිටිනුයේ විමසුම් ඇසිනි.

***ඇමරිකානු ජනාධිපතිවරයා වූ ජෝ බයිඩන් ඉදිරියේ ඇති අභියෝග*** පිළිබඳ ලබන කලාපයෙන් දැනගමු.

*නිපුනි බලගමගේ*
*මහජන සේවා නිලධාරී*
*සන්නිවේදන දෙපාර්තමේන්තුව*

**සන්නිවේදන දෙපාර්තමේන්තුව,**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,**
**ශ්‍රී ජයවර්ධනපුර,**
**කෝට්ටේ.**

දුරකථනය : +94 11 2777100
ෆැක්ස් : +94 11 2777227

**Parliament of Sri Lanka**
**@ParliamentLK**
**@slparliament**
**Parliament of Sri Lanka**

# නිලධර වීත්ති



**නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා**
**වේත්‍රධාරී**

කොළඹ ඉසිපතන විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබූ නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අභිනව වේත්‍රධාරීවරයා ලෙස කටයුතු කරයි.

2018 සැප්තැම්බර් මස 01 වන දින ඔහු ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වේත්‍රධාරී ලෙස පත් විය. ඔහු මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඉන්දියාවේ පාඨමාලාවක් හදාරා ඇත. එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, ඉන්දියාවී ලෝක් සභාව, චීනය වැනි රටවල අධ්‍යයන චාරිකාවල නිරතව පුහුණුව ලැබීම ඔහුගේ විශේෂත්වයකි.

ඔහුගේ පාර්ලිමේන්තු සේවය වසර 38 කි. වේත්‍රධාරී දෙපාර්තමේන්තුවේ වසර 19 ක් කටයුතු කර ඇත. පරිපාලන දෙපාර්තමේන්තුව, ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව, මුදල් හා සැපයුම් දෙපාර්තමේන්තුව, විදේශ සම්බන්ධතා සහ කෙටුම්පත් කාර්යාලය යන අංශ රැසක පාර්ලිමේන්තුව තුළ කටයුතු කර ඇත.

ශ්‍රී ලංකාවේ සහ ඕස්ට්‍රේලියාවේ රූපවාහිනී / ගුවන්විදුලි සාකච්ඡා කිහිපයකදී වේත්‍රධාරී ධුරයේ වගකීම පූර්වාදර්ශ, පරිචයන් සහ ක්‍රියා පටිපාටි පිළිබඳව ද අදහස් දක්වා ඇත.



**එන්.එස්.කේ. වෛද්‍යරත්න මහතා**
**අධ්‍යක්ෂ- පරිපාලන**

1961 වසරේ උපන් එන්. එස්. කේ වෛද්‍යරත්න මහතා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අභිනව පරිපාලන අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරයි.

කළුතර ඉංග්‍රීසි ඥානෝදය විද්‍යාලයෙන් සහ කළුතර තිස්ස මධ්‍ය මහා විද්‍යාලයෙන් ඔහු මූලික අධ්‍යාපනය හදාරා ඇත. IBM ආයතනයෙන් Higher Certificate of Human Resource Management යන පාඨමාලාව හදාරා ඇත.

පාර්ලිමේන්තු සම්ප්‍රදායන් සහ පාර්ලිමේන්තු ක්‍රමය පිළිබඳව විදෙස් රටවල් රැසක පුහුණුව ලබා ඇත. එතුමාගේ පාර්ලිමේන්තු සේවා කාලය වසර 40 කට අධිකය. සහකාර අධ්‍යක්ෂ - පරිපාලන/ නියෝජ්‍ය අධ්‍යක්ෂ - පරිපාලන ඇතුළු තනතුරු රැසක් එතුමා හොබවා තිබේ. පාර්ලිමේන්තුවේ දෙපාර්තමේන්තු රැසක කටයුතු කර ඇති හෙතෙම අත්දැකීම් බහුල නිලධාරියෙකි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලීය ක්‍රීඩා සංගමයේ ලේකම්වරයා වශයෙන් 1999 සිට 2009 දක්වා වසර 10ක් කටයුතු කොට ඇත. පරිපාලන දෙපාර්තමේන්තුවේ වෘත්තීය සංගමය වන පාර්ලිමේන්තු පරිපාලන කාර්ය මණ්ඩලයීය සංගමයේ (PASU) සභාපතිවරයා වශයෙන් අවස්ථා කිහිපයකදී ක්‍රියා කොට ඇත.



**නයනි ලොකුකොඩිකාර ද සිල්වා මහත්මිය**
**හැන්සාඩ් සංස්කාරක**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ හැන්සාඩ් සංස්කාරක ධුරය හොබවන නයනි ලොකුකොඩිකාර ද සිල්වා මහත්මිය කොළඹ අනුලා විද්‍යාලයේ ආදි ශිෂ්‍යාවකි. 1991 වර්ෂයේ කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී උපාධිය හැදෑරීම සඳහා සුදුසුකම් ලබා සිටියද එවකට රට තුළ පැවැති තත්ත්වය හේතුවෙන් ඇය පාර්ලිමේන්තුවට එක්වූයේ සිය මුල්ම රැකියාව වූ පිළිගැනීමේ නිලධාරිනියක (ඉංග්‍රීසි) ලෙසිනි.


1995 පෙබරවාරියේදී ඉංග්‍රීසි හැන්සාඩ් වාර්තාකාරිනියක් ලෙසින් හැන්සාඩ් දෙපාර්තමේන්තුවට එක්වූ ඇය 2004 මාර්තුවේදී එහි සහකාර සංස්කාරක(ඉංග්‍රීසි) ධුරයට පත් වූවාය. එම මහත්මිය ඉංග්‍රීසි භාෂාව සහ ඉගැන්වීම පිළිබඳව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් ගෞරව උපාධියක් සම්පූර්ණ කර ඇත.

2015 ඔක්තෝබරයේ දී නියෝජ්‍ය සංස්කාරක(ඉංග්‍රීසි) ධුරයට උසස් වූ නයනි ලොකුකොඩිකාර මහත්මියගේ වෘත්තීය ජීවිතය දක්ෂතා හා සුදුසුකම් සහිත කාර්ය මණ්ඩල සාමාජිකයන්ට පාර්ලිමේන්තුව දක්වන අනුග්‍රහය පිළිබිඹු කරන්නක් ද වේ.

# ඡායා ගැලරිය

## 20 වැනි සංශෝධන පනත් කෙටුම්පතට කථානායකවරයාගේ අත්සන තබන මොහොත...





## පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව





## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව







## පාර්ලිමේන්තුවට ලොව නන් දෙසින් සපැමිණි රාජ්‍ය තාන්ත්‍රිකයෝ...







